# සමාජීය ආචාර පද්ධති මත පීඩනයට පතවන ශවරක්ෂකයන්ගේ ජීවිතාභ්‍යන්තර ගැටළු පිළිබඳ අධ්‍යයනක් (නාගරික හා ග්‍රාමීය සමාජ ආශ්‍රයෙන්)

හිරමඩගම පඤ්ඤාසාර හිමි[1]

**සංක්ෂේපය**

බහු පීඩිත සාම්ප්‍රදායික චර්යාව නූතන සංවර්ධන යුගය තුළ ශ්‍රී ලංකාවේ ද දක්නට ඇත. එකියා මත සමාජයේ වර්ගවාදයක් බිහි වේ. ශවරක්ෂණය යනු මෘත ශරීරයේ මතු පැවැත්ම පිණිස සිදු කළ යුතු ක්‍රියාවලිය පදනම් වූ සමාජ ශුභ සාධනය මූලික වූ රක්ෂාවකි. ප්‍රාග් බෞද්ධ යුගයේ ආසියාතික ගෝත්‍රික සමාජයේ මෙන් නූතන ලාංකිය සමාජයේ පීඩනය ප්‍රමුඛ පුද්ගල විභේදනයක් දක්නට හැක. සාමාජීය, සාංස්කෘතික හා ආගමික වශයෙන් ඔවුන් හීන කොට සලකනු ලැබෙති.මේ අධ්‍යයනය පිණිස සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කොට ඇත. මෙහි නියදිය වශයෙන් ග්‍රාමීය සමාජය සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න නම් ග්‍රාමය ද නාගරික සීමාව සඳහා බත්තරමුල්ල නගරය ද තොරාගැනේ. එහිදි 15 දෙනා බැගින් වෙන වෙනම සසම්භාවීව පුද්ගලයන් තොරාගෙන ඇත. නානාවිධ ඇගයුම් මත මෙහෙයවනු ලබන ග්‍රාමීය හා නාගරික ආචාර පද්ධතියෙන් ශවරක්ෂකයන් කෙරෙහි ඇති පීඩනය විවිධ යැයි නිගමනය කළ හැක. නූතන සමාජ අධ්‍යයනය මඟින් නාගරිකයෝ නව්‍ය පිළිගැනීම් සමූහයකට ලක්වන අතර එය ධනවාදී ආර්ථික රාමුවක් මත පදනම් පුද්ගල අන්තර් ක්‍රියා රහිත සමාජ සංස්ථාවකි. මොවුන්ගේ අදහස් හා ආකල්පය අනේකාකාර වෙති. ග්‍රාමීය සමාජය සාප්‍රදායික වේ. සාම්ප්‍රදායික පිළිගැනීම් විශේෂයෙන් ගුරු කොට සලකනු ලබයි. ග්‍රාමීය සමාජය තුළ ශවරක්ෂකයන් හා ඔවුන්ගේ පවුල් සංස්ථාව පීඩනයට පත්වීම 70% පමණ ප්‍රතිශතයක් දත්ත ආශ්‍රයෙන් දක්නට හැක. ඔවුන් විසින් ශවරක්ෂකයන්ගේ දරුවන් ද අවතක්සේරු හා පිළිකුල් කරනු ලැබේ. පාරම්පරික ඉතිහාසගත තොරතුරු මගින් ද සාක්ෂි විද්‍යමානය. මෙයින් ප්‍රකට ප්‍රධාන සාධකය නම් නාගරිකයන් හෝ ගම්කයන් ආචාර ධර්මයන් කෙරෙහි ඇති විද්‍යාත්මක ඥානයේ ඌණත්වය යැයි නිගමනය කළ හැක. ආචාර වාදය වැනි කෘති අධ්‍යයනයට සාහිත්‍ය මූලාශය වශයෙන් භාවිත කොට ඇත.

***ප්‍රමුඛ පදඃ ශවරක්ෂකයා, ආචාර ධර්ම, නාගරික සමාජය, ග්‍රාමීය සමාජය***

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
hpannasara1@gmail.com